
1.5 විශේෂාංග රූප සටහන

## දේශීය ණය සංයුතියේ වෙනස්වීම: රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි ප්‍රවණතා

### දේශීය ණය ප්‍රසාරණය (පෞද්ගලික සහ රාජ්‍ය)




### පෞද්ගලික සහ රාජ්‍ය අංශයට ලබාදුන් ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස




සටහන්: 1. දේශීය ණය යනු බැංකු පද්ධතිය මගින් පෞද්ගලික අංශයට සහ රාජ්‍ය අංශයට ලබා දුන් මුළු ණය සහ අත්තිකාරම් ප්‍රමාණය වේ. රාජ්‍ය අංශයට ලබා දුන් ණය ප්‍රමාණය තුළ රාජ්‍ය සුරැකුම්පත්වල සිදු කළ ආයෝජන ඇතුළු රජය වෙත ලබා දුන් ණය සහ රජය සතු වාණිජ ව්‍යාපාර වෙත ලබා දුන් ණය ඇතුළත් වේ.
2. ණය සහ ද.දේ.නි.ය අතර අනුපාතය ගණනය කරනු ලබන්නේ අදාළ කාර්තුවට අනුරූප වසරකට ඇස්තමේන්තු කරන ලද නාමික ද. දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස එම කාර්තුව අවසානයේ පවතින සමස්ත ණය ප්‍රමාණය සැලකිල්ලට ගනිමිනි.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික අර්බුදයට පෙර වසරවල දී රාජ්‍ය මූල්‍ය අංශයේ ව්‍යුහාත්මක අසමතුලිතතා අඛණ්ඩව පැවතීම හේතුවෙන්, සිය ඉහළ යන මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට මහ බැංකුව ඇතුළුව දේශීය බැංකු අංශය තුළින් වැඩි වශයෙන් ණය ලබා ගැනීමට රජයට සිදුවිය. මේ හේතුවෙන් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ කුමන වෙනස්වීම් සිදුවුවත්, පෞද්ගලික අංශයට මූල්‍ය පද්ධතිය තුළින් ණය ලබා ගැනීමට පැවති අවකාශය සීමා විය. ආර්ථික අර්බුදය පැවති කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම සහ නියමිත වේලාවට ණය ගෙවීමට නොහැකි තත්ත්වයේ ඉහළ රාජ්‍ය ණය අවදානමක් පැවතිණි. එමගින් රජයට විදේශීය මූල්‍ය ප්‍රභවයන් වෙත ප්‍රවේශ වීමට තිබූ අවකාශය සීමා වීම හේතුවෙන් දේශීය මූලාශ්‍ර වෙත පමණක් යොමු වීමට සිදුවීමෙන් මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර විය. කෙසේ වෙතත්, මෑත කාලීන ආර්ථික අර්බුදයෙන් පසුව ක්‍රියාත්මක වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය සහ රජයේ අයවැය හිඟය මූල්‍යනය සඳහා මහ බැංකුව විසින් අරමුදල් සැපයීම අත්හිටුවීම ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික ස්වාධීනත්වය ඉහළ නැංවීම අරමුණු කරගත් නෛතික ප්‍රතිසංස්කරණ යනාදිය හේතුවෙන් අර්බුදයෙන් පසු ආර්ථිකය තුළ හිතකර තත්ත්වයක් නිර්මාණය වී ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය පහළ යෑම හේතුවෙන් පෞද්ගලික අංශය වෙත ණය ලබාගැනීම සඳහා අමතර අවකාශයක් නිර්මාණය විය. ඒ අනුව, ආර්ථික අර්බුදය පැවති කාල සීමාව තුළ පහළ ගිය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සහ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මධ්‍යයේ ණය ලබා ගැනීමේ පිරිවැය අඩු වීමෙහිත් සහාය ලබමින් 2025 වසර අවසානය වන විට 31.2%ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශයට ලබා දුන් ණය ආර්ථික අර්බුදයට පෙර පැවති මට්ටමට වඩා පහළ මට්ටමක පවතී. මේ අතර, සලකා බලන කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.